# 6 - මං තනන්නෝ

## කෙටිකතාව යනු කුමක්ද?



නූතන ගද්‍ය සාහිත්‍යාංගයක් වන කෙටිකතාව ප්‍රබන්ධයක් හෙවත් කල්පිතයකි. එය 19 වන සියවසේ මැද භාගයේදී පමණ ආරම්භ වූ බව පිළිගැනේ.

කෙටිකතාව එක් ප්‍රබල සිද්ධියක් හෝ අවස්ථාවක් තේමා කර ගනිමින් නිර්මාණය වේ. එහි චරිත කිහිපයක් තිබිය හැකි වුවත් ප්‍රධාන චරිත තිබිය හැක්කේ එකක් පමණි. අනිකුත් චරිත අවශේෂ චරිත වේ. එම අවශේෂ චරිත ප්‍රධාන චරිත බැබළවීම සඳහා උදව් වේ.

කෙටිකතාවක කතා වින්‍යාසය වැදගත් අංගයකි. එය කතන්දරයක මෙන් මුල මැද හෝ අග ලෙස අනුපිළිවෙලින් කියා අවසන් කරන්නක් නොවේ. කෙටි කතාවක මනා හේතුඵල සම්බන්ධතාවක් මත ගොඩනැඟුණු කතා වින්‍යාසයක් තිබීම අවශ්‍ය වේ. එවිට කෙටිකතාව කෙරෙහි පාඨක විශ්වාසය නොබිඳී පවතී.

කෙටිකතාවක යොදා ගැනෙන භාෂාවේ ප්‍රබල බව එහි සාර්ථකත්වයට බලපාන ප්‍රධාන කරුණකි. කෙටිකතාව සංක්ෂිප්ත වූත්, රසාලිප්ත වූත් භාෂාවක් වීම වැදගත් වේ. එසේම සංකේත භාවිතය තුළින් රසවත් බව වැඩි වේ.

කෙටිකතාවක් රසයක් මෙන් ම ගැඹුරු ප්‍රඥාවක් හෙවත් ජීවන දර්ශනයක් ඇතුළත් වීම අවශ්‍ය වේ. කෙටිකතාවක මතුපිටින් දිවෙන ආශ්වාදයට යටින් මනුෂ්‍යත්වය හා මානව දයාව පිළිබඳ ගැඹුරු අරුතක් හෙළිවීම අවශ්‍ය වේ. එවිට එය උසස් කෙටිකතාවක් ලෙස සම්මානයට පාත්‍ර වෙයි.

අන්තර්ගතය : Y.P.M.P.විමලසිරි - ගුරු උපදේශක, සිංහල (ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය)
සැකසුම : W.G.P.සංජය අමරතුංග - රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය



මං තනන්නෝ කෙටිකතාව මහගමසේකර විසින් රචනා කරන ලද සාර්ථක කරන ලද සාර්ථක කෙටිකතාවකි.(කම්කරුවන් පිරිසක් පාරක් සකස් කිරීමේ සිද්ධියක් ඊට පාදක වී ඇත. එම සිද්ධිය චරිත කීපයක් යොදා ගනිමින් විකාශනය කිරීමෙන් කෙටිකතාව නිර්මාණය වී තිබේ.)

1922 දී ගම්පහ රදාවාන ගමේ දී උපත ලැබූ සේකර; මූලික අකුරුකරණය සඳහා රදාවාන පිරිමි පාසලට ඇතුළත් වූ අතර පසුව කිරිඳිවැල සිංහල පිරිමි පාසලෙන් හා ශ්‍රී සීලවංශ පෞද්ගලික පාසලින් ද ගම්පහ ලෝරන්ස් විදුහලෙන් වැඩිදුර අධ්‍යාපනය ද ලැබීය.

මුලින් ම ගුරුවරයෙකු ලෙස පත්වීම ලැබූ සේකර එම වකවානුවේදී ම ලංකාදීප, රසවාහිනී ආදී මාධ්‍යවලට ලිපි සැපයීම ආරම්භ කළේය. 1958 දී රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තකයෙකු ලෙස ද 1960 දී ගුවන් විදුලියට ද සම්බන්ධ විය.

කොළඹ යුගයේ නවක කවි පරපුරේ කවීන් අතර මහගම සේකර සුවිශේෂී ස්ථානයක් හිමිකර ගන්නේ එතුමාගේ සුවිශේෂී දක්ෂතා හේතුවෙනි. මහගමසේකරයන්ගේ දක්ෂතා ක්ෂේත්‍ර ගණනාවක් මගින් විහිදී ඇති ආකාරය මෙසේ දැක්විය හැකි ය.

- <u>කවියෙකු ලෙස එතුමා කල නිර්මාණ.</u>
  සක්වා ලිහිණි/ හෙට ඉරක් පායයි/ මක් නිසා ද යත්/ රාජතිලක, ලයනල් හා ප්‍රියන්ත/ බෝඩිම/ නොමියෙමි
- <u>නවකතාකරුවෙකු ලෙස.</u>
  තුංමංහන්දිය/ මනෝමන්දිර
- <u>ගීත රචකයෙකු ලෙස</u>
  I. සරල ගීත - විශාල සංඛ්‍යාවක් රචනා කර ඇත.
  II. චිත්‍රපට පසුබිම් ගීත - සාරවිට/ ගැටවරයෝ/ ආදරයයි කරුණාවයි/ දෙලොවක් අතර/ රන්සළු/ වෙස් ගත්තෝ/ බිනර මලී/ සත් සමුදුර
  III. නාට්‍ය ගීත - කරදිය මුද්‍රා නාට්‍යය/ කුණ්ඩල කේසී/ මුදු පුත්තු

- <u>චිත්‍ර හා මූර්ති ශිල්පියෙකු ලෙස</u>

  1969 දී කොළඹ කලාගාරයේ පැවැත්වූ චිත්‍ර ප්‍රදර්ශනයට අමතර ව විදේශ රටවල ද ප්‍රදර්ශන පවත්වා ඇත.
- <u>නාට්‍ය ශිල්පියෙකු ලෙස</u>

  ස්වර්ණතිලකා/ චෝර පබ්බත මෙන් ම ගුණසේන ගලප්පත්ති රචනා කළ මුදු පුත්තු නාට්‍යය.

තවත් බොහෝ කලක් නිර්මාණකරණයේ යෙදීමට තිබිය දී හදිසියේ 1976 ජනවාරි මස මෙලොවින් සමු ගත්තේය.

The National e-learning Portal for The General Education

අභ්‍යාසය

කෙටිකතාවේ මතුපිටින් දිවෙන ආස්වාදයට යටින් ''මානව දයාව'' හා ''පන්ති පරතරය'' පිළිබඳ තොරතුරු දැක්වේ. පහත දැක්වෙන ප්‍රකාශ අයත් වන්නේ මානව දයාවට/ පන්ති පරතරයට යන්න තෝරා අදාළ වගුවේ අංක යොදන්න.

1. ''මේ මිනිස්සු තමයි මහ පොළොවේ නියම පුත්තු''
2. ''එහෙත් ඔහුගේ සමාජ තත්ත්වය ඊට බාධාවක් විය''
3. අව්වේ පිච්චි පිච්චි වැඩ කරන මේ මිනිසුන් කෙරෙහි මහේන්ද්‍ර තුළ භක්තියක් ඇති විය.
4. සුළු වැටුපක් ලබා ගැනීම සඳහා මේ මිනිසුන් කොතරම් වෙහෙස විය යුතු ද?
5. අර මිනිස්සුන්ටත් වතුර තිබහ ඇති. තේ ටිකක් දුන්නොත් නරක ද?
6. අර මහත්තයා කොහේද ලොකු රස්සාවක් කරන කෙනෙක් කිව්වා නේද?
7. තම සුකුමාරකම ගැන ලැජ්ජාවක් මහේන්ද්‍රට ඇති විය.
8. කිසිසේත් කය නොවෙහෙසවන තමාට ඔවුන්ගේ මෙන් හත් අට ගුණයක වැටුපක් ලැබෙතැයි......
9. කය වෙහෙසා වැඩ කරන මොවුහු ඊට විශාල සේවයක් කරති.

| මානව දයාව | පන්ති පරතරය |
|---|---|
| අංක ..................................<br>..................................<br>..................................<br>..................................<br>.................................. | අංක ..................................<br>..................................<br>..................................<br>..................................<br>.................................. |

අන්තර්ගතය : Y.P.M.P.විමලසිරි - ගුරු උපදේශක, සිංහල (ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය)
සැකසුම : W.G.P.සංජය අමරතුංග - රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය